## කොළඹ දිසා අධිකරණයේදී ය.

කොළඹ 10, ශ්‍රී විපුලසේන මාවත,
අංක. 167/4 දරණ ස්ථානයේ
නිහාල් ශ්‍රී අමරසේකර.

පැමිණිලිකරු.

නඩු අංකය: 19849/එම්.ආර්.

ස්වභාවය:- මුදල් අය කර ගැනීම.

-එරෙහිව-

වටිනාකම:- රු. 300,000,000.00

කාර්ය පටිපාටිය:- සාමාන්‍ය

කොළඹ 2, ස්ටේපල්ස් වීදියේ පිහිටි
"විසුම්පාය" යන ස්ථානයේ සහ
කොළඹ 5, කිරුළ පෙදෙසේ,
අංක. 37 දරණ ස්ථානයේ
ගාමිණී ලක්ෂ්මන් පීරිස්.

විත්තිකරු.

vvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvvv

දිසා විනිසුරු : එස්.ජේ.ඩබ්.අබේපිටිය මැතිතුමා ඉදිරිපියේදී ය.

සටහන් කලේ:- ල/ලේ.මාලති රුද්‍රිගු විසිනි.

දිසා අධිකරණය - කොළඹ.

නඩු අංකය:-19849/එම්.ආර්.

1998.07.30

### නි යෝ ග ය

මෙම නඩුවේ විත්තිකරුට මෙම අධිකරණය විසින් කාර්ය සටහන් අංක (5) අනුව 1998.02.23 වෙනි දින පැමිණිලිකරු ඉදිරිපත් කරන ලද විචාරන මාලාවට එය භාරදී දින 10 ක් ඇතුලත පිළිතුරු සැපයීමට නියෝග කර ඇති අතර විත්තිකරු එයට පිළිතුරු සැපයීම ප්‍රතික්ෂේප කර ඇත. ඒ අනුව පැමිණිලිකරුගේ ඉල්ලීම මත අධිකරණය විසින් විත්තිකරුට සිවිල් නඩු විධාන සංග්‍රහ පනතේ 100 වැනි වගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කර ඇති අතර පසුව පැමිණිලිකරු විචාරනවලට පිළිතුරු නොසැපයීම නිසා විත්තිකරු ඉදිරිපත් කල උත්තරය කපා හරින ලෙසට ඉල්ලීමක් කර ඇත. එයට අමතරව පැමිණිලිකරු කාර්ය සටහන් අංක (09) යටතේ විත්තිකරුගේ සන්තකයේ ඇති ලේඛන එළිදරව් කරන ලෙසට නියෝගයක් කිරීමට පැමිණිලිකරුගේ

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
Tr. & Audit 141 a
(E 2" c.d.) 12/46

නීතිඥ මහතා ඉල්ලීමක් කර ඇති අතර, ඒ අනුව 102 වගන්තිය යටතේ එසේ කරන ලෙසට විත්තිකරුට අධිකරණයෙන් නියම කර ඇති අතර, විත්තිකරු එසේ නොකර විරෝධතා පමණක් ඉදරිපත් කල නිසා ඒ අනුවද විත්තිකරුගේ උත්තරය කපා හරින ලෙසට පැමිනිල්ලේ නීතිඥ මහතා ඉල්ලීමක් කර තිබුනි. මෙම කරුණු දෙකම පරීක්ෂණයට තබා ඇති අතර එම පරීක්ෂණයේදී දෙපාර්ශ්වයටම ලිඛිත දේශණ ඉදරිපත් කිරීමට අවසර දී ඇති අතර ඒ අනුව දෙපාර්ශ්වයම ලිඛිත දේශණ ඉදිරිපත් කර ඇත. මෙම නයෝගය එහි ප්‍රතිඵලයකි.

මේ අනුව පැමිනිලිකරු විසින් සිවිල් නඩු විධාන සංග්‍රහ පනතේ 94 වැනි වගන්තිය යටතේ විත්තිකරුට නිකුත් කරන ලද විචාරනවලට විත්තිකරු විසින් පිළිතුරු නොදීම නිසා විත්තිකරුගේ උත්තරය කපා හරින ලෙසට පැමිනිලිකරු කරන ලද ඉල්ලීම ප්‍රථමයෙන් සලකා බැලීම වටී. මෙහිදී ප්‍රථමයෙන් පෙනී යන කරුණක් නම් විත්තිකරු විචාරනවලට පිළිතුරු දීම දිව්රුම් පෙත්සමකින් කර නැති නිසා එම විරෝධතා ප්‍රතික්ෂේප කළයුතු බවට පැමිනිලිකරු ඉල්ලීමක් කර ඇති නමුත් අධිකරණය විසින් 1998.03.16 වෙනි දින දුන් නියෝගය පරිදි පැමිණිලිකරු විසින් එම ඉල්ලීමට පසුව සිවිල් නඩු විධාන සංග්‍රහ පනතේ 100 වගන්තිය යටතේ නියෝගයක් කරන ලෙසට ඉල්ලා සිටි නිසා පෙර ඉල්ලීම ඉල්ලා අස් කරගෙන ඇති බවට නිගමනය කර ඇත. ඉන් පසුව අධිකරණය විසින් පැමිණිලිකරුගේ ඉල්ලීම මත විත්තිකරුට සිවිල් නඩු විධාන සංග්‍රහ පනතේ 100 වගන්තිය යටතේ නියෝගයක් කර ඇත.

මෙහිදී පෙනෙන කරුණක් නම් විත්තිකරුගේ නීතිඥ මහතා තම ලිඛිත දේශණවලින් ඉදරිපත් කර ඇති තර්කය වන්නේ මෙම ඉල්ලීම එනම්, විචාරනවලින් පිළිතුරු දීම / පැමිනිලිකරු විසින් ද්වේශ සහගතව

විත්තිකරුට හිරිහැර පැමිණවීමේ චේතනාවෙන් කර ඇති බවත්, ඒ බව විරෝධතාවලට අමුණා ඇති පුවත්පත් වාර්තා අනුව සනාථ වන බවත්, එයට අමතරව නඩු විභාගයකදී විචාරන භාරදීමේ මූලික පරමාර්ථය වන්නේ එම නඩුවේ කටයුතු ඉක්මන් කිරීම සඳහා බවත්, කෙසේ නමුත් මෙම විචාරන භාරදීම සඳහා ඇත්ත වශයෙන්ම සිදුවී ඇත්තේ නඩුවේ කටයුතු ප්‍රමාද වීමක් බවත්, ඒ කෙසේ වුවත් පැමිණිලිකරුගේ නඩුව සාමාන්‍ය අපහාස නඩුවක් නිසා ඒ මත පිහිටා විත්තිකරුට ඉදිරිපත් කර ඇති විචාරන 236 කට පිළිතුරු දීමට නියෝග කල නොහැකි බවයි.

මෙහිදී පෙනෙන කරුණක් නම් මෙම නඩුවේ විසඳීමට ඇති ප්‍රධාන කරුණ වන්නේ පැමිනිල්ලේ 17 වන ජේදයේ දක්වා ඇති පරිදි එම කරුණු වලින් පැමිණිලිකරුට අපහාසයක් සිදු වුනාද යන්නයි.

මෙහිදී පෙනෙන කරුණක් නම් විත්තිකරුගේ තර්කය වන්නේ සිවිල් නඩු විධාන සංග්‍රහ පනතේ 100 වගන්තිය යටතේ නියෝගයක් කිරීමට පෙර විචාරනවලට පිළිතුරු නොසැපයීම සම්බන්ධයෙන් විත්තිකරුහට අණධනයක් නියම කළ නොහැකි බවයි. එම තර්කය සත්‍යය වන අතර 94 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද විචාරන මාලාවකට පිළිතුරු දීම පැහැර හරින ලද අවස්ථාවක එය 98 වගන්තිය යටතට වැටෙන්නේ නැතිනම් අධිකරණය විසින් එම තැනැත්තාට 100 වැනි වගන්තිය යටතේ නියෝගයක් කළයුතුය. විත්ති-කරුගේ තර්කය වන්නේ විත්තිකරුහට අධිකරණය විසින් 100 වැනි වගන්තිය යටතේ නියෝගයක් කර නැති බවයි. මෙම අධිකරණය විසින් විත්තිකරුට 100 වැනි වගන්තිය යටතේ නියෝගයක් කර ඇත්තේ

1998.03.06 වැනි දිනයි. එදින නියෝගය බැලීමේදී පැහැදිලිවම පෙනී යන්නේ පැමිණිල්ලේ ඉල්ලා ඇති පරිදි විත්තිකරුට විරුද්ධව 109 වන වගන්තිය යටතේ ක්‍රියා කිරීමට පෙර අධිකරණය විසින් විත්තිකරුට කරන සාධාරණයක් වශයෙන් 100 වගන්තිය යටතේ නියෝගයක් කරන බවයි. එසේම අධිකරණය තවදුරටත් නිගමනය කර ඇත්තේ, 100 වගන්තිය යටතේ නියෝගයක් කර ඇති අවස්ථාවක ඒ සම්බන්ධයෙන් පරීක්ෂණය අවසන් නො කොට ප්‍රධාන නඩු විභාගය පැවැත්වීමට නොහැකි බවයි. මේ අනුව සිවිල් නඩු විධාන සංග්‍රහ පනතේ 100 වගන්තිය යටතේ ඉල්ලීමකට නියෝගයක් කලේ නැතැයි යන තර්කය පදනම් විරහිත වන අතර සිවිල් නඩු විධාන සංග්‍රහ පනතේ 100 වගන්තිය යටතේ අධිකරණයෙන් කල නියෝගය වචනයෙන් වචනයට පැහැදිලි කර නැති නමුත් එදින පැහැදිලිවම අධිකරණය විසින් විත්තිකරුට 100 වගන්තිය යටතේ නියෝගයක් කර ඇත. 100 වගන්තිය යටතේ කරන ලද නියෝගය වැටහුනේ නැති යයි විත්තිකරුගේ ජ්‍යෙෂ්ඨ නීතිඥ මහතාට සහ විත්තිකරුට ඔවුන්ගේ තත්වය අනුව පැවසීමට නොහැකි බව මෙම අධිකරණයේ නිගමනයයි. අනෙක් අතට 100 වගන්තිය යටතේ නියෝගය කරන අවස්ථාවේදී විත්තිකරුගේ නීතිඥ මහතා අධිකරණයේ සිටි අතර, එම නියෝගයේ අපැහැදිලිතාවයක් තිබුනේ නම් ඒ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කර ගැනීමක් කිරීමට අවස්ථාවක් තිබුනි. මේ අනුව 100 වැනි වගන්තිය යටතේ නියෝගයක් කර නැති නිසා 109 වගන්තිය යටතේ ක්‍රියා කිරීමට නොහැකිය යන්න විත්තිකරුගේ තර්කය මා ප්‍රතික්ෂේප කරමි.

එසේ නමුත් පෙත්සම්කරුට පිළිතුරු දීමට ඉදිරිපත් කර ඇති විචාරන මෙම නඩුවේ කාරණාවලට ඉතාමත් පුළුල් වශයෙන් සඳහන් කර ඇති විචාරන නිසා ඒවාට පිළිතුරු දීමට බැඳී නැති බව යනුවෙන් දක්වන පෙත්සම්කරුගේ තර්කයට එක්තරා පදනමක් ඇති බව පෙනී යයි. මෙයට පෙර සඳහන් කල පරිදි පැමිණිලිකරු විසින් පෙත්සම්කරුට මෙම නඩුව පවරා ඇත්තේ සාමාන්‍ය අපහාසය සම්බන්ධයෙන් නඩුවකි. එවැනි නඩුවකදී පැමිණිලිකරු පෙත්සම්කරුට පිළිතුරු දීමට ඉදිරිපත් කර ඇති 236 ක් වැනි විචාරන සංඛ්‍යාවකින් යුත් විචාරන මෙම නඩුවේ කරුණුවලට එක එල්ලේම අදාල නොවන බවට පෙත්සම්කරු නැගූ තර්කය සමඟ මෙම අධිකරණයද එකඟ වෙයි. මන්ද, බැලූ බැල්මටම පෙත්සම්කරුට පිළිතුරු දීමට ඉදිරිපත් කර ඇති බොහෝ විචාරන මෙම නඩුවට අදාල වන හෝ ඒවායින් නඩු විභාගය කෙටිවීමක් සිදු වන බව පෙනී යන්නේ නැත. උදාහරණයක් වශයෙන් පැමිණිලිකරු ඉදිරිපත් කර ඇති 2(අ) විචාරනය වන්නේ පෙත්සම්කරු පසුගිය ආණ්ඩුව සමඟ සමීප සබඳතාවයක් පැවැත්වූයේ නැතිනම් ඔහු විසින් පත්වීම් ගනනාවක් භාර ගන්නා ලද්දේ කෙසේද යන්නයි. 2(ආ) විචාරනය වූයේ පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර බණ්ඩාරනායක මහතා ට පසුගිය ආණ්ඩුවේ පිල් මාරු කිරීමට උපදෙස් දීමට පෙත්සම්කරු ඒ මහතා ගේ රොස්මීඩ් පෙදෙසට ගියේ නොමැතිද යන්නයි. 7(ඕ) විචාරනයේ විමසා ඇත්තේ ජනාධිපති තිඹිඳ සහ පාර්ලිමේන්තු මන්ත්‍රී චොක්සි මහතා සමඟ පෙත්සම්කරු ඇඩි පෞද්ගලික සම්බන්ධතාවයක් තිබූ බව පිළිගන්නේද යන්නයි. 13(ඉ.2) දරන විචාරනයෙන් පවසා ඇත්තේ

නීතිය උගත් සහ ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධියක් ලත් නීතිය පිළිබඳ මහාචාර්ය යවරයෙකු වන විත්තිකරු පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ දැන සිටිය යුතු බව තේද යනුවෙති.

මෙම විචාරන අනුව පැහැදිලිව පෙනී යන්නේ එම විචාරනවලට විත්තිකරුට ( ඔව්) හෝ (නැත) යනුවෙන් පිළිතුරු දීමට නොහැකි බවත්, ඒවා බැලූ බැල්මට මෙම නඩුවට අදාල නොවන බවත්ය. පිළිගත් නීතිය අනුව විචාරන ඉදිරිපත් කිරීමෙන් බලාපොරොත්තු වන්නේ විචාරන ඉදිරිපත් කල පාර්ශ්වය විසින් සනාථ කලයුතු කරුණු සම්බන්ධව අනෙක් පාර්ශ්වයෙන් පිළිගැනීමක් ලබා ගැනීම පමණකි. එසේ නමුත් අපහසු කිරීම වැනි මෙවැනි නඩුවකදී ඉදිරිපත් කර ඇති විචාරන සියල්ලම එම සීමාවෙන් ඔබ්බට ගොස් ඇති බවත්, එය හරස් ප්‍රශ්න ඇසීමේ ස්වභාවයක් ගෙන ඇති බවත්, මෙම අධිකරණයේ නිගමනයයි. මේ අනුව විත්තිකරු විසින් ඉදිරිපත් කල විචාරනවලට පිළිතුරු නොදීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද කරුණු මේ අධිකරණය පිළිගන්නා අතර ඒ අනුව විත්තිකරු ඉදිරිපත් කල විචාරනවලට පිළිතුරු දීමට විත්තිකරු බැඳී නැතැයි මේ අධිකරණය නිගමනය කරන අතර එබැවින් විචාරනවලට පිළිතුරු නොදීම නිසා සිවිල් නඩු විධාන සංග්‍රහ පනතේ 109 වගන්තිය යටතේ විත්තිකරුගේ උත්තරය කපා හැරීමට පැමිනිලිකරු කරන ලද ඉල්ලීම මෙයින් ප්‍රතික්ෂේප කරමි. ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයේ ගාස්තුද විත්තිකරුට පැමිනිලිකරුගෙන් ලබා ගතහැකිය.

පැමිණිලිකරුගේ අනෙක් ඉල්ලීම වූයේ විත්තිකරුට 1998.03.09 වෙනි දින නියෝගය මගින් ලේඛන අනාවරණය කරන ලෙසට නියෝගයක් කර ඇති නමුත් ඔහු එම ලේඛන අනාවරණය නොකර ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රතික්ෂේප කර ඇති බවත් 102 වගන්තිය යටතේ ලේඛන සියල්ලම අනාවරණය කිරීම සඳහා ඉල්ලීමක් කල අවස්ථාවක එය දිව්රුම් පෙත්සමක් මාර්ගයෙන් ඉදිරිපත් කිරීමට විත්තිකරු බැඳී සිටින අතර ප්‍රතික්ෂේප කිරීමක් විත්තිකරුට කලහැක්කේ 103 වගන්තිය යටතේ ඒවා ඉදිරිපත් කිරීමට නියෝග කල අවස්ථාවකදී පමණක් බව පවසමින් විත්තිකරු විසින් ඉදිරිපත් කල උත්තරය ඒ අනුව 109 වගන්තිය යටතේ කපා හරින ලෙසට ඉල්ලා ඇත.

මෙහිදී පෙනෙන කරුණක් නම්, පැමිණිලිකරුගේ ඉල්ලීම මත මේ අධිකරණය විසින් 1998.03.09 වෙනි දින විත්තිකරු ඔහුගේ විත්තිවාචකය සම්බන්ධයෙන් විශ්වාසය තබන ලියවිලි ඉදිරිපත් කරන ලෙසට නියම කර ඇත. එම නියෝගය භාර ගත් විත්තිකරු ඒ සම්බන්ධයෙන් ඔහුගේ සන්තකයේ ඇති ලේඛන මොනවාදැයි අනාවරණය නොකර 1998.03.17 වෙනි දින විරෝධතා ඉදිරිපත් කරමින් අදාල ලේඛන විත්තිකරුගේ සන්තකයේ පුද්ගලික තත්වයෙන් නැති බවත්, එසේ නමුත් ඒවා වරප්‍රසාද ලේඛන බවත් පවසා ඒවා හෙළි කිරීම ප්‍රතික්ෂේප කර ඇත.

මේ අනුව පැමිණිලිකරුගේ තර්කය වන්නේ ලේඛන අනාවරණය කරන ලෙසට 102(1) වගන්තිය යටතේ විත්තිකරුවෙකුට අධිකරණය මගින් නියෝගයක් කර ඇති අවස්ථාවක එසේ කිරීම ප්‍රතික්ෂේප කිරීමට විත්තිකරුවෙකුට නොහැකි බවත්, විත්තිකරු විසින් කළයුත්තේ

102(2) වගන්තිය යටතේ එම ලේඛණ දිවුරුම් පෙත්සමක් මාර්ගයෙන් අනාවරණය කිරීම බවත්, එසේ නමුත් 103 වගන්තිය යටතේ ලේඛන ඉදිරිපත් කිරීමට විත්තිකරුට නියමයක් කල අවස්ථාවේදී ඒවා ඉදිරිපත් කිරීමට විත්තිකරුට ප්‍රතික්ෂේප කිරීමට හැකි බවයි.

විත්තිකරු තම විරෝධතාවලින් දක්වා ඇත්තේ ඔහුට ලේඛන අනාවරණය කිරීමට කරන ලද නියෝගය නොපැහැදිලි බවත්, ඒ කෙසේ නමුත් ඔහුගේ පෞද්ගලික සන්තකයේ ලේඛන නැති අතර, තිබෙන ලේඛන වරප්‍රසාද ලේඛන බවයි.

මෙහිදී පෙනෙන කරුණක් නම් 102(1) වගන්තිය යටතේ කරන ලද නියෝගය පැහැදිලි නොමැති බව විත්තිකරු පවසා ඇත. 1998.03.09 වෙනි දින කරන ලද නියෝගයේ අධිකරණය නියෝග කර ඇත්තේ පැමිණිලිකරුගේ නඩුවට අදාල සහ විත්තිකරු ඔහුගේ විත්තිවාචකය සම්බන්ධයෙන් විශ්වාසය තබන ලියවිලි ඉදිරිපත් කිරීමට නොතිසි නිකුත් කිරීමට නියම කරන බවයි. විත්තිකරුගේ නීතිඥ මහතාගේ තර්කය වන්නේ මෙය ලේඛන අනාවරණය කිරීමට කරන ලද නියෝගයක් නොවන බවයි. මේ අධිකරණයට වැටහෙන සිංහල අන්දමට අධිකරණයේ නිගමනය වන්නේ අධිකරණය විසින් විත්තිකරුට 1998.03.09 වෙනි දින නියෝගයක් කර ඇත්තේ පැමිනිලිකරුගේ නඩුවට හෝ විත්තිකරුගේ විත්ති වාචකයට අදාල වන ලියවිලි අනාවරණය කරන ලෙසටයි. මෙම නියෝගය සම්බන්ධයෙන් මේ අධිකරණය විසින් විත්තිකරුට යවා ඇති නොතිසිය (බී) වශයෙන් නඩු වාර්තාවේ ගොනු කර ඇති අතර, එහි ඇත්තේද එම ලියවිලිවල විස්තර නොතිසිය භාරදී දින හතක් (7) ඇතුලත දිවුරුම් පෙත්සමක්

මාර්ගයෙන් ප්‍රකාශයට පත් කරන ලෙසටයි. මේ අනුව ලේඛන අනාවරණය කිරීම සම්බන්ධයෙන් විත්තිකරුට යවන ලද දැන්වීම පැහැදිලි නැතැයි යන විත්තිකරුගේ තර්කය පදනමක් නැති බව මේ අධිකරණයේ නිගමනයයි. සිවිල් නඩු විධාන සංග්‍රහ පනතේ 102(1) වගන්තිය යටතේ ලේඛන අනාවරණය කිරීම සම්බන්ධයෙන් අධිකරණය මගින් නියෝගයක් කර ඇති අවස්ථාවක එම නියෝගය ලත් තැනැත්තා කළයුත්තේ එම නිවේදනයේ දක්වා ඇති දිනට පෙර දිව්රුම් පෙත්සමක් මාර්ගයෙන් ඔහුගේ සන්තකයේ ඇති ලියවිලි අනාවරණය කිරීමයි. මේ අනුව පැහැදිලිව පෙනී යන්නේ 102 වගන්තිය යටතේ නියෝගයක් ලද පුද්ගලයෙකුට ගතහැකි එකම ක්‍රියා මාර්ගය වන්නේ ඔහුගේ සන්තකයේ ඇති ලේඛන මොනවාදැයි අනාවරණය කිරීම,, සහ එසේ අනාවරණය කරන අතරම ඒවා ඉදිරිපත් කිරීමට කරුණු සහිතව විරෝධතා ඉදිරිපත් කිරීම පමණක් බවයි. මේ අනුව 102(1) වගන්තිය යටතේ කරන ලද නියෝගයක් පිළිපැදීම ප්‍රතික්ෂේප කරමින් විරෝධතා ඉදිරිපත් කිරීමට අයිතියක් නැති බව මේ අධිකරණයේ නිගමනයයි. අනෙක් අතට විත්තිකරු පවසන පරිදි 102 (1) වගන්තිය යටතේ ඔහුට නිකුත් කරන ලද නියෝගය අපැහැදිලි යයි විත්තිකරු පවසන නමුත් එය නිකුත් කර දින 8 ක් ඇතුලත විත්තිකරු ඒ මත ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කරමින් ඒ සම්බන්ධයෙන් දිව්රුම් පෙත්සමක් ඉදිරිපත් කර ඇත.

විත්තිකරුගේ විරෝධතා අනුව පෙනී යන කරුණක් නම් විත්තිකරු තම විරෝධතා වල 02 වැනි ඡේදයේ පවසා ඇත්තේ ලේඛන ඔහු සන්තකයේ නැති බවයි. නැවත වරක් එම විරෝධතාවලට

04 වැනි ඡේදයේ පවසා ඇත්තේ තඩුවට අදාල ලේඛණ පෞද්ගලික තත්වයෙන් ඔහුගේ සන්තකයේ නැති බවයි. විත්තිකරුගේ උත්තරයේ 39 වැනි ඡේදයේ අනුව මෙම තඩුවට අදාල කාලසීමාවේදී ඔහු නියෝජ්‍ය මුදල් ඇමති ලෙසට සිටි බව පිලිගෙන ඇත. මේ අනුව පෙනී යන කරුණක් නම් විත්තිකරු එක් අතකින් තඩුවට අදාල ලේඛන ඔහු තඩුව තරඟ කරන තත්වය මත ඔහුගේ සන්තකයේ ඇති බවට පවසන නමුත් ඒවා ඔහුගේ පෞද්ගලික සන්තකයේ නැති බව අනෙක් අතින් පවසන බවයි. මේ තර්කයන් දෙකම එකම අවස්ථාවේදී ගැනීමට විත්තිකරුට අයිතියක් නැති බව මේ අධිකරණයේ නිගමනයයි.

විත්තිකරුගේ තර්කයක් වන්නේ මෙම ලේඛණ ඔහුගේ සන්තකයේ නැති බවයි. සන්තකය යනුවෙන් අදහස් කරන්නේ නති නෛතික අයිතියක් හෝ ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ඇති අයිතිය බව " සුන්දරම් එදිරිව ගොන්සාල්වේස්" 51 නව නිති වාර්තාව 15 වැනි පිටු වේ වාර්තා කර ඇති නඩු තීන්දුවේ තීරණය කර ඇත.

විත්තිකරුගේ උත්තරයේ 39 වැනි ඡේදය අනුව ඔහු තඩුවට අදාල සියළුම කාලවලදී නියෝජ්‍ය මුදල් ඇමති ලෙසට ක්‍රියා කල බව පිලිගෙන ඇත. තත්වය එසේ නම් මෙම පැමිනිලිකරු අනාවරණය කිරීමට ඉල්ලා ඇති ලේඛණ සම්බන්ධයෙන් ඔහුට ක්‍රියා කිරීමට හැකි ලේඛණ බව පෙනී යන අතර පෙර කී නඩු තීන්දුව අනුව එම ලේඛණ ඒ අනුව ඔහුගේ සන්තකයේ ඇති බවට නිගමනය කිරීමට සිදුවේ.

විත්තිකරුගේ තවත් තරකයක් වන්නේ මෙම ලේඛණ වර ප්‍රසාද ලේඛන බවයි. සිවිල් නඩු විධාන සංග්‍රහ පනතේ 103 ඒ(1) වගන්තියෙන් දක්වා ඇත්තේ රජයේ පාර්ශවකරුවෙකු වී ඇති අවස්ථාවක රජයට විරුද්ධවද ලේඛන අනාවරණය කි කිරීම හෝ ලේඛන පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් නියෝග කලහැකි බවයි. 103,ඒ(2) වගන්තියේ දක්වා ඇත්තේ අදාල අමාත්‍යවරයාගේ මතය අනුව එම ලේඛන අනාවරණය

කිරීමෙන් වැළකී සිටිය හැකි බවයි. මෙම නඩුවේ පෙනෙන කරුනක් නම් රජය මෙම නඩුවේ පාර්ශ්වකරුවෙකු නොවන අතර විත්තිකරු අනාවරණය කිරීමට නියෝග කර ඇති ලේඛණවලට අදාල ඇමතිවරයා නොවේ. ඒ අනුව විත්තිකරුට මෙම ලේඛන වරප්‍රසාද ලේඛන ලෙසට පැවසීමට නොහැකි බව මේ අධිකරණයේ නිගමනයයි.

විත්තිකරුගේ නීතිඥ මහතා තම ලිඛිත දේශණවලදී පවසා ඇත්තේ 102 වගන්තිය යටතේ ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් අණඩනයක් 109 වගන්තිය යටතේ පැනවිය නොහැකි බවයි. කෙසේ නමුත් 109(1) වගන්තිය යටතේ පැහැදිලිව දක්වා ඇත්තේ 109 වගන්තියට අයත් පරිච්ඡේදය යටතේ කරන ලද නියෝගයකට එනම්, ලේඛණ අනාවරණය කිරීම වැනි නියෝගයක් මත ඒ අනුව ක්‍රියා කර නැති අවස්ථාවක පැමිනිලිකරුවකුගේ නම් නඩුව නිෂ්ප්‍රභා කිරීමටත්, විත්තිකරුවකුගේ නම් ඔහුගේ විත්තිවාචකය කපා හැරීමටත්, අනෙක් පාර්ශ්වයෙන් ඉල්ලීමක් කර ඇති විටෙක ලක් වන බවයි. මෙම නඩුවේ විත්තිකරු ලේඛන අනාවරණය කිරීම සම්බන්ධයෙන් කල නියෝගය පිලිගෙන නැති නිසා ඔහුගේ උත්තරය කපා හරින ලෙසට පැමිනිලිකරු විසින් පැහැදිලිවම ඉල්ලීමක් කර ඇත.

මෙයට පෙර දැක්වූ කරුණු අනුව විත්තිකරු ලේඛණ අනාවරණය කිරීම සඳහා මේ අධිකරණය විසින් 102 වගන්තිය යටතේ කරන ලද නියෝගය පැහැර පැර ඇති බව මේ අධිකරණය නිගමනය කර ඇත. ඒ අනුව පැමිනිලිකරුගේ ඉල්ලීම පරිදිද 109(1) වගන්තිය යටතේ ක්‍රියා කරමින් විත්තිකරුගේ උත්තරය කපා හරින අතර ඒකපාක්ෂික විභාගයට නියම කරමි. මෙම පරීක්ෂණයේ ගාස්තු පැමිනිලිකරුට විත්තිකරුගෙන් බාගත හැකියි.

අත්සන් කලේ:- එස්. ජේ. ඩබ්. අබේපිටිය
දිසා විනිසුරු - කොළඹ
1998.07.30

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
Tr. & Audit 141 *a*
(E 2" c.d.) 12/46



(21) <u>98.07.30</u>

<u>නි යෝ ග ය.</u>

දෙපස නීතිඥවරු ඉදිරිපිටදී නියෝගය

ප්‍රකාශ කළෙමි. නියෝගය ගොනු කරමි.

විත්තිකරුගේ උත්තරය කපා හැර ඒකපාක්ෂික විභාගයට

නියම කරමි.

ඒ.පා. විභාගය

03/09/98

අත්.කලේ:- එස්. ජේ. ඩබ්ලිව්. අබේපිටිය

දිසා විනිසුරු - කොළඹ

04.06.98

---

ඉහත සඳහන් වන්නේ කොළඹ දිසා අධිකරණයේ අංක: 19849/එම්.ආර්. දරන නඩුවේ ගොනු කොට ඇති නඩු සිරස හා 98.07.30 දින නියෝගයේ සහ 98.07.30 දින කාර්ය සටහනේ සත්‍ය පිටපතක් බව මෙයින් සහතික කරමි.

යතුරු ලිවීම:-

සැසඳීම:-




රෙජිස්ට්‍රාර්.

එල්. එන්. ධර්මසිරි
සාමදාන විනිශ්චයකාර
අතිරේක රෙජිස්ට්‍රාර්
දිසා අධිකරණය - කොළඹ.

19/M/57375
98.08.03